# සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

# දකුණු පළාත

## දකුණු පළාතේ සමුපකාර සමිති සමග ගනුදෙනු කරන පාර්ශවයන් වෙත කෙරෙන විශේෂ දැනුම්දීමයි

සමුපකාර සමිති පනත/ දකුණු පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි දකුණු පළාතේ සමුපකාර සමිති නියාමනය දකුණු පළාත් සමුපකාර දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

තවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ කැබිනට් මණ්ඩලයේ තීරණය පරිදි දකුණු පළාතේ සමුපකාර ග්‍රාමීය බැංකු හා මූල්‍ය සේවා සමුපකාර සමිති නියාමන කමිටුවේ එකඟතාව මත දකුණු පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්/රෙජිස්ට්‍රාර් විසින් නිකුත් කර ඇති බැංකු නියාමන චක්‍රලේඛ අනුව තැන්පතු සඳහා උපරිම පොලී අනුපාතික සීමාවන් දක්වා ඇත.

එහෙත් මෙම චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව යමින් සමහර සමුපකාර සමිති විසින් ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහාත්, එමගින් කෙටිකාලීනව මූල්‍ය අවශ්‍යතා පිරිමසා ගැනීම සඳහාත් ඉහළ පොලී අනුපාතික ලබාදී එම සමිති මූල්‍ය අර්බුදයන්ට ලක්වූ අවස්ථා නිරීක්ෂණය වී ඇත.

එබැවින් පහත සඳහන් පොලී අනුපාතික සීමාවන් ඉක්මවන ආයෝජනයන් අවදානම් සහගත බැවින් ඒ පිළිබඳ ඔබගේ දැඩි අවධානය යොමු කර සමුපකාර සමිතිවල මූල්‍ය ආයෝජනයන් (මුදල් තැන්පත්) සිදු කරන ලෙස මෙයින් නිවේදනය කරනු ලැබේ.

**සාමාන්‍ය ඉතුරුම් තැන්පත් - 3.75%**

(මෙම සීමාව 4.50% ක උපරිමයක පවත්වා ගැනීමට හැකිය)

**ස්ථාවර තැන්පත් - 8.50%**

**කල් පිරීමේ කාලය වසර 01 (මාස 12) වන**

(මෙම සීමාව 9.00% ක උපරිමයක පවත්වා ගැනීමට හැකිය)

දකුණු පළාතේ සමුපකාර සමිතිවල ආයෝජන සිදු කිරීමේදී (විශේෂයෙන් මහා පරිමාණ මුදල් තැන්පත් කිරීම්වලදී) සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ පහත දුරකථන අංක වලින් විමසා වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.

**සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්,**
**දකුණු පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව,**
**නො. 147/3, පෙට්ටිගලවත්ත, ගාල්ල.**

**දු.අං. - 091-2234380 ෆැක්ස් - 091-2282291**
**ගාල්ල - 091-2234308 මාතර - 041-2222329 හම්බන්තොට - 047-2256015**